# සිංහල භාෂාව හා සාහිත්‍යය
## 7 - ශ්‍රේණිය



# අපේ ලෝහ තාක්ෂණයේ යටගියාව




බප/ හො/ දොඹගොඩ සීලරතන ම.වි

සැකසුම :-  යූ. කේ.ඩී. උදයංගී.

දුලාරි ඉනෝකා.

- මිනිසා සත්ත්ව ලෝකයේ සෙසු සාමාජිකයන්ගෙන් වෙනස් වන ප්‍රධාන ලක්ෂණයක් වන්නේ විවිධ මෙවලම් හා උපකරණ භාවිතයයි.
- ක්‍රි.ව. පළමු සහස්‍රකය තෙක් ආදි මානවයා විසින් බහුලව භාවිත කරන ලද්දේ ශිලා මෙවලමය.
- මෙවලම් හා උපකරණ තැනීමට ආදි මානවයා ගල්, දැව, සත්ත්ව ඇට කටු හා මැටි වර්ග භාවිතා කලේය.
- පසු කාලීනව බහු විවිලෝහ වර්ග භාවිතා කරමින් උපකරණ මෙවලම් තනා ගත් අතර ඒවා තනා ඇත්තේ පාෂාණ නිස්සාරණයෙනි.
- මිනිසා මුලින්ම භාවිතා කල ලෝහ වර්ග වන්නේ තඹ, රන්, රිදී, ඊයම් ආදියයි.

# අතීත ලංකාවේ ලෝහ භාවිතය පිළිබඳ දක්නට ලැබෙන සාධක

- බ්‍රාහ්මීය ලෙන් ලිපි වල පහත යෙදුම් දක්නට ලැබේ.

  - *කබර - යකඩ කර්මාතයේ නියුක්ත ශිල්පියා.*
  - *තබකර - තඹ කර්මාතයේ නියුක්ත ශිල්පියා.*
  - *තුලදර - රන් කර්මාතයේ නියුක්ත ශිල්පිය.*

- ඒ ඒ ලෝහ වර්ග සම්බන්ධයෙන් ප්‍රසිද්ධියට පත් ප්‍රදේශ වේ.

  ** රිදීගම , තුලාධාරගම , තම්බපිට්ට*

- යුධ කටයුතු වලදී **දුනු , හී , පලිහ , හෙල්ල , තෝමර** ආදී ආයුධ සඳහා ලෝහ භාවිතා කර ඇත.


://trisinhala.blogsp

# ආගමික සාධක

- දුටුගැමුණු රජු සමයේ මහා විහාරයේ ඉදි කෙරුනු

සත්මහල් ගොඩනැගිල්ල ප්‍රචලිත වූයේ **"ලෝවාමහාපාය"** නමිනි.

*එහි අරුත ලෝහයෙන් තැනූ ගොඩනැගිල්ල යන්නයි.*

- අභයගිරි හා ජේතවන ආරාම වල ලෝහ භාන්ඩ නිෂ්පාදනය කරන කම්හල් පැවති ඇත.
- අභයගිරියේ කාසි නිෂ්පාදනය සඳහා භාවිතා කල අච්චු හා රන් පිඬු හමු වී තිබේ.

# කලා නිර්මාණ හා කලා කෘති

- බුද්ධ ප්‍රතිමා
- බෝදිසත්ව හා දේව ප්‍රතිමා
- විවිධ කරඬු
- තඹ හා ලෝහ වලින් තැනූ පාත්‍ර
- විවිධ කාසි වර්ග

*• අමිශ්‍ර රන් භාවිතයෙන් පමනක් නිර්මාණ තැනිය නොහැකි බැවින් තඹ හා රිදී වැනි ලෝහ සමග මිශ්‍ර කර සාදාගෙන ඇත.*



ඇතා සහ ස්වස්තික කාසිය



බෝධිය සහ ස්වස්තිකය



බෝධිය සහ ස්වස්තිකය







# ලෝහ තහඩු මත අකුරු ලිවීමේ සම්ප්‍රදායක් පැවතීම


**පහත කරුණු මගින් එය සනාත වේ.**

- යාපනය දිස්ත්‍රික්කයේ වල්ලිපුරම් නම් ගමේ වසභ රජුගේ කාලයට අයත් අකුරු ලියූ රන් තහඩුවක් හමු වී තිබීම.
- දේවානම්පියතිස්ස රජු දවස රන් පතක වාක්‍යයක් ලියවා තබා ඇත.
- වළගම්බා රජු දවස ත්‍රිපිටකය රන්පත් වල ලියවූ බව දැක්වේ.

# ලෝහ නිස්සාරණය

***ලෝහ නිස්සාරණය යනු***

*බොහෝ ලෝහ වර්ග පරිසරයේ පවතින්නේ විවිධ මූලද්‍රව්‍ය සමග සංයෝග වී ඛනිජ වශයෙනි. මෙම ඛනිජ ද්‍රව්‍ය ඉහළ උෂ්ණත්වයට රත් කර ලෝහ වෙන් කර ගැනිම ලෝහ නිස්සාරණය ලෙස සරලව හැදින්විය හැක.*


අඟුරු
යපස්
අඟුරු
යපස්
දර

# ඉහතින් දැක්වෙන්නේ අතීතයේ යකඩ නිස්සාරණය කර ඇති ආකාරයයි

*යකඩ නිස්සාරණය කිරීමේදී අපද්‍රව්‍ය බොර ලෙස වෙන් අතර*

** යකඩ නිස්සාරණය කල ස්ථාන හදුනා ගැනීමට පුර විද්‍යාඥයෝ මෙම බොර විසිරී තිබීම යොදා ගනී.*

** පුරා විද්‍යාත්මක සාධක වල කාල නිර්ණය කිරීම සදහා කාබන් 14 පරීක්ෂණය යොදා ගනී.*

# ශ්‍රී ලංකාවේ පැරණි ලෝහ නිස්සාරණය පිළිබඳ සාධක

- ලංකාවේ යකඩ භාවිතය පිළිබඳ මුල්ම සාධක ක්‍රි. පූ. 900 ට පමණ අයත් බව අනුරාධපුර හා නුවර කැණීම් වලින් සොයාගෙන ඇත.
- යකඩ නිස්සාරණය සඳහා භාවිතා කල උඳුනක් සීගිරි කෞතුකාගාරයේ දක්නට ලැබේ.
- බලන්ගොඩ සමනල වැව ප්‍රදේශයේ පැරණි යකඩ උඳුනක් සොයාගෙන ඇත.
- සේරුවිල ප්‍රදේශයෙන් ක්‍රි. පූ. 400ට පමණ අයත් තඹ උඳුනක් සොයාගෙන ඇත.
- සේරුවිල ප්‍රදේශයට ආසන්නව ඉලංකතුරෙයි පැරණි වරාය පිහිටා තිබීමෙන් තඹ අපනයනය කර ඇති බව පැහැදිලි වේ.

# වාක්‍ය නිර්මාණය

**නංගී** **මල්** **කඩයි**

( උක්තය) ( කර්මය) (ක්‍රියාව)

- මෙහි ***'කඩයි'*** යන ආඛ්‍යාතයෙන් කඩන්නේ කවුරුද යන ප්‍රශ්නය මතු වෙයි. පිළිතුර වන්නේ ***'නංගී'*** යන්නයි.

  එය වාක්‍යයේ ***'උක්තයයි '.***

- කඩන්නේ මොනවාද යන්න ඊලඟට මතුවන ප්‍රශ්නයයි.

  එයට පිළිතුර වන්නේ ‘ මල්’ යන්නයි

  එය වාක්‍යයේ කර්මයයි.

- නංගී කරන්නේ කුමක්ද යන  ප්‍රශ්නය මතු කරන්න. එයට පිළිතුර වන්නේ ‘කඩයි’ යන්නයි.

  එය වාක්‍යයේ ක්‍රියාවයි.

- මෙවැනි වාක්‍ය වල උක්තය කර්තෘට අනුව ආඛ්‍යාතය තබනු ලබයි. කර්තෘ උක්ත වන අතර කර්මය අනුක්ත වේ.